# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2025

**6 ශ්‍රේණිය**

## භූගෝල විද්‍යාව - I/ II

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2 යි

**I කොටස**

**ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

✶ **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ රාශියක් එක් වීමෙන් මෙම පරිපාලන ඒකකය සකස් වෙයි.
1) පළාත 2) රට 3) දිස්ත්‍රික්කය
4) ග්‍රාම නිළධාරී කොට්ඨාසය

02) දකුණු පාළාතට අයත් දිස්ත්‍රික්කය මින් කුමක්ද?
1) කොළඹ 2) පුත්තලම 3) බදුල්ල 4) මාතර

03) නැගෙනහිර හා දකුණ අතර පිහිටි දිශාව වන්නේ
1) උතුරු දිශාව 2) ගිණිකොළ දිශාව
3) බටහිර දිශාව 4) ඊසාන දිශාව

04) මිනිසාට හානි ගෙන දෙන විස සහිත උරගයෙක් ලෙස සැලකෙන සත්වයා නම්
1) මීයා 2) වවුලා 3) කුරුමිණියා 4) පොළඟා

05) ලී බඩු සඳහා ප්‍රසිද්ධ මොරටුව නගරය පිහිටා ඇත්තේ කුමන දිස්ත්‍රික්කයේ ද?
1) කොළඹ දිස්ත්‍රික්කය 2) කළුතර දිස්ත්‍රික්කය
3) කෑගල්ල දිස්ත්‍රික්කය 4) ගම්පහ දිස්ත්‍රික්කය

✶ **පහත වැකි හරි නම් (√) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

06) වර්ෂාපතනය මනිනු ලබන්නේ මිලිමීටර් වලිනි. ( )

07) සුළගේ වේගය මැනීම සඳහා සුළං දිශා දර්ශකය යොදා ගනියි. ( )

08) හින්දු බැතිමතුන් හජ්ජි උත්සවය සමරනු ලබයි. ( )

09) ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක 25 කි. ( )

10) රාජ්‍ය ඔසුසල මගින් ජනතාවට සහන මිලට ඖෂධ ලබා දෙයි. ( )

✶ **ප්‍රශ්න අංක 11 - 15 දක්වා ඇති ප්‍රශ්න වලට පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්නග**

11) පැතලි තලයක අඳින ලද නිර්මාණය ....................................... ලෙස හඳුන්වයි.

12) වර්ෂාව ඇති වීමට පෙර අහසෙහි .................................... ඝන වළාකුළු දක්නට ලැබෙයි.

13) ............................... වෙස් මුහුණු සඳහා ප්‍රසිද්ධය.

14) ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් වෙන්වන පටු මුහුදු තීරය ................................ සමුද්‍ර සන්ධියයි.

15) භූමියේ ස්වභාවය අනුව කඳුකර ප්‍රදේශවල ................................ භෝග වගා කරයි.

**(අම්බලන්ගොඩ / අඳුරු පැහැති / සිතියම / පෝක් / තේ හා රබර්)**

✶ **අංක 16 - 20 දක්වා දී ඇති පද යුගලයන් ගැළපෙන පරිදි යා කරන්න.**

| | |
|---|---|
| 16) සංචාරක පක්ෂියෙකි. | වේයා |
| 17) පරිසරයට හිතකර සතෙකි. | දිශාව |
| 18) සිතියමක වැදගත් අංගයකි. | ගොළුබෙල්ලා |
| 19) ශ්‍රී ලංකාවට ආසන්න රටකි. | අවිච්චියා |
| 20) වගාවන්ට හානි කරන සතෙකි. | ඉන්දියාව |

(ලකුණු 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 04කට පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

01) ඔබේ පාසලට අදාළ පහත සඳහන් තොරතුරු ලියන්න.

i. ඔබේ පාසල පිහිටි ගම හෝ නගරය නම් කරන්න.

ii. ඔබේ පාසල පිහිටි ග්‍රාම නිළධාරී කොට්ඨාසය ලියන්න.

iii. ඔබේ පාසල අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ලියන්න.

iv. ඔබේ පාසල අයත් වන දිස්ත්‍රික්කය ලියන්න.

v. ඔබේ පාසල පිහිටි පළාත නම් කරන්න.

(ල 10)

vi. ඔබ අධ්‍යාපනය ලබන පාසලේ දළ සැලැස්ම අඳින්න.

(ල 10)


02)

i. දිශාව හඳුනා ගැනීමට භාවිතා කළ හැකි උපකරණය කුමක්ද? (ල 2)

ii. ප්‍රධාන දිශා දෙකක් හා අනු දිශාවක් නම් කරන්න. (ල 3)

iii. පාසලේ සිට A, B, C, D, E යන ස්ථාන පිහිටි දිශාවන් නම් කරන්න. (ල 5)

iv.



03)


i. කාලගුණික අංග දෙකක් නම් කරන්න. (ල 2)

ii. කාලගුණික තොරතුරු දැන ගැනීමෙන් අපට ඇතිවන වාසි තුනක් ලියන්න. (ල 3)

iii.

a) කාලගුණය පිළිබඳ අනාවැකි පල කරන සතුන් දෙදෙනෙක් නම් කරන්න. (ල 2)

b) ජල චක්‍රයේ පහත A, B, C අවස්ථා නම් කරන්න. (ල 3)




04)

i. සංචාරක පක්ෂීන් දෙදෙනෙකු නම් කරන්න. (ල 2)

ii. වගාවන්ට හිතකර සතුන් තිදෙනෙක් ලියන්න. (ල 3)

iii. ශාක වලින් ලැබෙන ප්‍රයෝජන පහක් ලියන්න. (ල 5)

05)

i. ඔබ ජීවත් වන පරිසරය තුළ වාසය කරන ජන වර්ග දෙකක් ලියන්න. (ල 2)

ii. වියළි කලාපය තුළ වගා කරන එළවළු වර්ග තුනක් ලියන්න. (ල 3)

iii.

a) සත්ත්ව පාලනය යටතේ ඇති කරනු ලබන සතුන් තිදෙනෙක් නම් කරන්න. (ල 3)

b) කෘෂි කාර්මික කටයුතු නිසා පරිසරයට සිදුවන හානි දෙකක් ලියන්න. (ල 2)

06)

i. රජයේ මැදිහත් වීමෙන් ඔබට ලබාදෙන සේවාවන් දෙකක් නම් කරන්න. (ල 2)

ii. ඔබ ඉහතින් දැක්වූ සේවාවන් මගින් ඉටුවන කාර්යයන් තුනක් සඳහන් කරන්න. (ල 3)

iii. එම සේවාවන් භුක්ති විඳීමේදී ඔබගෙන් ඉටු විය යුතු යුතුකම් පහක් ලියන්න. (ල 5)

07)

i. භූගෝලීය ලක්ෂණ බෙද දැක්විය හැකි කොටස් දෙක නම් කරන්න. (ල 2)

ii. භූගෝලීය ලක්ෂණ තුනක් ලියන්න. (ල 3)

iii. ඔබේ පාසල පිහිටි භූ දර්ශනය පිළිබඳ වාක්‍ය පහක් ලියන්න. (ල 5)

08)

i. ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් වෙන්වන පටු මුහුදු තීරය නම් කර එහි දුර කිලෝමීටර් වලින් ලියන්න. (ල 2)

ii. ශ්‍රී ලංකාවේ පිහිටි වැදගත් ස්ථාන තුනක් ලියන්න. (ල 3)

iii. 'දියුණුවන අපේ ශ්‍රී ලංකාව' මාතෘකාව යටතේ කෙට වාක්‍ය පහක් ලියන්න. (ල 5)